සිරිලක එකළු කළ අසිරිමත් පහන් ටැඹ



# පරම පූජනීය මිහිඳු මහරහතන් වහන්සේ

(ධර්මදානය පිණිසයි)

**"ධම්මෝ හි වාසෙට්ඨා, සෙට්ඨෝ ජනේතස්මිං**
**දිට්ඨේ චේව ධම්මේ, අභිසම්පරායේ ච."**

වාසෙට්ඨයෙනි, මෙලොවෙහි ත්, පරලොවෙහි ත්
ජනයා අතර ධර්මය ම ශ්‍රේෂ්ඨ වෙයි !

*- අග්ගඤ්ඤ සූත්‍රය - භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ*

# සිරිලක එකළු කළ අසිරිමත් පහන් ටැඹ
# පරම පූජනීය මිහිඳු මහරහතන් වහන්සේ

© සියලුම හිමිකම් ඇවිරිණි.

**ශ්‍රී බු.ව. 2562 වප් මස පුර අටවක පොහෝ දින**

සම්පාදනය : මහමෙව්නාව භාවනා අසපුව
වඩුවාව, යටිගල්ඔළුව, පොල්ගහවෙල.
දුර : 037 2244602
info@mahamevnawa.lk
www.mahamevnawa.lk

සිරිලක එකළු කළ අසිරිමත් පහන් ටැඹ

# පරම පූජනීය
# මිහිඳු මහරහතන් වහන්සේ

(ධර්මදානය පිණිසයි)

# පෙරවදන

ඔබ මේ ගැන සිතුවෙහි ද? යම් හෙයකින් ඔබ බුදුරජාණන් වහන්සේ නමක් ගැන නොදන්නෙහි නම්, උතුම් බුදුවදනක් අසාත් නැතිනම්, සඟරුවනක් දැකීම තබා සිවුරක්වත් දැක නැත්නම්, මහාසෑයක්, බෝධීන් වහන්සේ නමක් දැක නැත්නම්, කුසල් - අකුසල්, පින් - පව් කියා දෙයක් අසා නොමැති නම්, කොටින් ම කිසි බණපදයක් නොඅසා ඇත්නම් මේ වන විට ඔබ කෙබඳු කෙනෙක් ද? කියා මොහොතක් සිතන්න. එසේ වූයේ නම් මේ සිතෙහි ඇති රාග, ද්වේෂ, මෝහාදී කෙලෙස් සමග පමණක් එක් වූ තිසරණ රහිත ජීවිතය තිරිසන් සමාන ය. වැද්දන් සමාන ය. තවත් කාමුක වූ සුද්දන් පිරිසක් සමාන ය. ලංකාවෙහි විද්‍යමානව පවතින වෙහෙර - විහාර - ස්ථූප වන්දනා, පුද පූජා ආදියෙන් හෙබි සොඳුරු සංස්කෘතිකාංග නොමැති නම් මේ වන විට මෙය තවත් ම්ලේච්ඡ දිවයිනක් පමණි. තවත් යටත්විජිතයක් පමණි. අනේක දුක් කම්කටොලු විඳිමින් පැරණි මුතුන් මිත්තන් මේ දිවයින බේරාගත්තේ කුමක් හෙයින් ද? මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට බුදු සසුන වැඩමවාගෙන නොඑන්නට සිංහල ජාතිය මේ වන විටත් ලොවෙන් අතුගෑවී හමාරය. සිංහලයෝ මිහිඳු මහරහතන් වහන්සේට සදා ණයගැත්තෝ ය.

මෙලක්බිමෙහි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ නොවන්නට ලොවෙහි නිර්මල බුදුවදන් කවුරු නම් දනිත් ද? ඒ ත්‍රිපිටක බුද්ධ වචනය ලක්දිවට දායාද කළෝ මිහිඳු මහරහතන් වහන්සේ ම ය. ලක්වැසියන්ට සුගති රැකවරණයත් මගඵල

අමා නිවනත් දායාද කළ මිහිඳු මහරහතන් වහන්සේට කෘතගුණ සලකා කෙසේ නම් අවසන් කරන්ට ද?

එහෙත් මෑතකදී 'බුදුහු ලක්දිව උපන්හ' යි කියමින් අහස පොළොව නුහුලන මිථ්‍යාවක් උපදවාගත් ශ්‍රමණ වේශධාරී පිරිසක් මිහිඳු මහරහතන් වහන්සේගේ ගුණකඳ ද හෙළාදකින්නට තරම් සැහැසි වී සිටිති. ඒ මිසදිටුවන් හට මිහිඳු මහරහතන් වහන්සේව පෙනෙන්නට බැරිය. අප මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් නිරිඳුන් හට වදාළෝ "සමණා මයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා" "මහරජ, අපි ධර්මරාජයන් වහන්සේගේ ශ්‍රාවක වූ ශ්‍රමණයෝ වම්හ." යනුවෙනි. නූතන ව්‍යාජ රහතුන්ට ශ්‍රාවක යන වචනය අප්‍රිය ය. 'මම රහත් වෙමි, අනාගාමී වෙමි, සකදාගාමී වෙමි, සෝවාන් වෙමි' ආදී වචන කියමින් තමන්ගේ අවබෝධයක් හුවාපාන්නට කැසකවති. "භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක" යන්න පැවසීමට ඔවුහු විරුද්ධ වෙති. අඳෝමය...! සිංහලයන්ට ගිය කල දසාවක හැටි..!

අපට අනුබුදු කෙනෙකු බඳු අපගේ පරම පූජනීය කළ්‍යාණමිත්‍ර වූ මිහිඳු මහරහතන් වහන්සේගේ උතුම් ජීවිතයෙන් ස්වල්පමාත්‍රයක් හෝ ඉගෙන ගන්නට ලැබීම මහත් වාසනාවකි. මහ සයුරේ දියබිඳක් දිවගා මහසයුර ලුණු රසයෙන් යුක්ත බව නුවණැත්තෝ දැනගනිති. එසෙයින් ම අප මිහිඳු මහරහතන් වහන්සේගේ ගුණයෙන් බිඳක් සිතෙහි තවරා උන්වහන්සේ මහ ගුණ සයුරක් බවට නුවණැත්තෝ සිත් පහදා ගනිත්වා! මිහිඳු මහරහතන් වහන්සේ බඳු අසහාය ධර්මදූතයන් වහන්සේ නමක් පිළිබඳ අපට වචනයෙන් වර්ණනා කළ නොහැකිය. කෙටියෙන් පැවසුවහොත් කිවහැක්කේ

මහානාම තෙරුන් මහාවංශයෙහිදී උන්වහන්සේ හැඳින්වූ වචනය වන "සත්ථුකප්පෝ" 'ශාස්තෘන් වහන්සේ සමාන වන සේක' වශයෙනි. ඊටත් වඩා වර්ණනා කුමට ද?

අපගේ පරම පූජනීය වූ කල්‍යාණමිත්‍ර වූ මිහිඳු මහරහතන් වහන්සේගේ අසිරිමත් ගුණයට උපහාර පිණිස ඉදිකරන ලද මනරම් මිහිඳු මණ්ඩපය ඒ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ සිරිපා කමල් අබියස වනපස මලක් වේවා! මහාවංශයෙන් උපුටාගන්නා ලද මේ චරිතාපදානය මියුරු සුවඳක් සේ දසත පැතිරේවා!

# මිහිඳු මහරහතන් වහන්සේට වන්දනා කිරීම

**යෝ සත්ථුකප්පෝ කල්‍යාණමිත්තෝ -**
**මහාඤාණී ජිනත්‍රජෝ**
**සෝ ලංකාදීපමාගම්ම - ජෝතයී බුද්ධසාසනං**
**තං වීතරාගං ලංකාදීපප්පසාදකං -**
**වන්දාමි පරිනිබ්බුත මහා මහින්දං**

උතුම් සම්බුදු පුත් රුවන වූ - අපට අනුබුදු රුවන බඳු වූ
මහා නුවණැති කලණ මිත් වූ - යම් මහරහත් උතුමෙක්
දඹදිවින් මෙහි වැඩම කොට - බුදු සසුන බැබළවූවෙද
මුළු ලක්දිව ම පැහැදුණු - වීතරාගිව පිරිනිවන් වැඩි
අපගේ මිහිඳු මුනිඳුට - වඳිමි මම සාදරයෙන්

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස
**ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!**

# අසිරිමත් මිහිඳු චරිතාපදානයෙන් බිඳක්....!

අපගේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා දෙසිය දහඅට වසරක් ගත වූයේය. එකල්හි ලාභ සත්කාර හේතුවෙන් කසාවත් දරාගෙන බුදුසසුනට වැද සිටි අන්‍ය තීර්ථකයෝ උතුම් බුද්ධ වචනය කෙලෙසන්නට වූහ. මේ උවදුර වළක්වනු පිණිස දුර දක්නා නුවණැති මහරහතන් වහන්සේලා 'තිස්ස' නමැති මහා බ්‍රහ්මරාජයෙකුට මනුලොව වඩින්නට ඇරැයුම් කළාහ.

ධර්මාශෝක නිරිඳුත් ඒ තිස්ස බ්‍රහ්මයා වූ අපගේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේත් එක්ව සිදුකරන ලද ශාසන සංශෝධනය නිසා සැට දහසක් වූ අන්‍ය තීර්ථකයෝ සසුනෙන් බැහැර කරන ලදහ. සිවුරු හරවන ලදහ. එකල්හී පිරිසිදු සංඝයා වහන්සේ සමගිව උපෝසථ කර්මය කළ සේක.

අපගේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ අනේක ගණනින් යුතු භික්ෂු සංඝයා අතරින් බියතැතිගැනීම් රහිත වූ, විසාරද භාවයට පත් වූ, ෂඩ් අභිඥාලාභී, සිව්පටිසම්භිදාලාභී රහත් භික්ෂූන් වහන්සේලා දහස් නමක් තෝරාගත් සේක. ඒ තුන්වන ධර්ම සංගායනාව පිණිස ය. උන්වහන්සේලා විසින්

දඹදිව පාටලීපුත්‍රයෙහි අසෝකාරාමයේදී තුන්වන ධර්ම සංගායනාව කරනු ලැබුවාය. ඒ සඳහා නව මාසයක් ගත විය. එකල්හී මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ උපසම්පදාවෙන් වස් සැත්තෑ දෙකක්ව සිටි සේක. සංගායනාව අවසන්හි වූ මහා පවාරණයෙහිදී මහා පෘථිවි තොමෝ සාදුකාර දෙන්නියක සෙයින් කම්පා වූවාය. මේ වන විට අපගේ මිහිඳු මහරහතන් වහන්සේ ද දහස් ගණනින් වූ සඟ පිරිසට ධර්මය උගන්වමින් පාටලීපුත්‍රයෙහි වැඩහුන් සේක. මේ මිහිඳු මහරහතන් වහන්සේ දවස ජම්බුද්වීපයෙහි කථාව යි.

මෙතැන් පටන් අපගේ පරම පූජනීය කළ්‍යාණමිත්‍ර මිහිඳු මහරහතන් වහන්සේගේ කථාව ය.

## මහපිනැති මිහිඳු කුමරුන්ගේ උපත

එකල දඹදිව බින්දුසාර මහරජාණන් විසින් සිය වැඩිමහල් පුත් කුමරු වූ අසෝක කුමරු හට යුවරජ තනතුරු පවරා අවන්ති රට භාරදෙන ලදී. ඒ අවන්ති රටට රාජකීය ගමන් යන අසෝක යුවරජු උජ්ජේනි නුවරට යන්නට පෙර වේදිස නගරයේ දේව සිටුවරයාගේ මාළිගයේ නවාතැන් ගත්තේය.

ඒ දේව සිටුවරයාට දේවී නම් ඉතා ශෝභාසම්පන්න සිටුදියණියක් සිටියාය. දේවී සිටුකුමරිය දුටු සැණින් අසෝක යුවරජු හට ඈ පිළිබඳ සිත් ඇති වූයේය. තම සිතෙහි හටගත් කරුණ දේව සිටුතුමාට දැනුම් දුන් විට ඔහු සිය දියණිය අසෝක යුවරජු හට සරණපාවා දුන්නේය. අසෝක යුවරජු දේවී කුමරියත් සමග උජ්ජේනි හෙවත් උදේනි නුවරට වාසය පිණිස ගියේය.

අසෝක යුවරජු නිසා දේවී කුමරියගේ කුසින් උදේනි නුවරදී ඉතා ශෝභාසම්පන්න වූ කුමරෙක් උපන්නේය. ඒ කුමරු මිහිඳු නම්. පුත්කුමරු ඉපදී දෙවසරක් ගිය තැන දේවී කුමරියට ඉතා සොඳුරු දියණියකුත් ලැබිණි. ඒ දියණිය සංඝමිත්තා නම්. අසෝක යුවරජු හට පාටලීපුත්‍රයෙහි මහාරාජ පදවිය ලැබුණු කල්හි දේවී කුමරිය විසින් සිය දරු දෙදෙනා පාටලීපුත්‍රයෙහි අසෝක රජු වෙත පිටත් කොට යවන ලද්දාහ. ඈ වේදිසා නගරයේ සිය සිටුමැදුරට පැමිණ වාසය කළාය.

## ධර්මාශෝක මහරජුගේ ශාසන උරුමය

නිග්‍රෝධ සාමණේර මහරහතන් වහන්සේ නිසා චණ්ඩාශෝකව සිටි අශෝක රජු ධර්මාශෝක බවට පත්වූයේය. ධර්මාශෝකයන් තුළ බුද්ධ ශාසනය කෙරෙහි ප්‍රමාණාතික්‍රාන්ත ආදර භක්තියක් තිබුණි. හේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද ධර්මය ධර්මස්කන්ධ අසූහාරදහසකින් යුක්ත බව අසා අසූහාරදහසක් වෙහෙර විහාරයන්ගෙන් බුදු සසුන පුදන්නට සිතුවේය. ඒ විහාර සියල්ල පූජා කිරීම සිදුවූයේ එක් වෙලාවකදී ය. ධර්මාශෝකයන්ගේ චිත්තප්‍රසාදය පිණිස මහරහතන් වහන්සේලා විසින් 'ලෝකවිවරණ පූජා' නමින් ප්‍රාතිහාර්යයක් මගින් අශෝක නිරිඳුන් හට එක්තැනක සිට සියල්ල දකින්නට සලස්වන ලද්දේය.

බුද්ධ කාලයේදීවත් අශෝකයන් තරම් ත්‍යාග ශීලී දායකයෙක් නොසිටි බව අසා හේ මහා සතුටකට පත්වූයේය. "එසේ වී නම් ස්වාමීනී, මා වැන්නෙක් උතුම් බුදු සසුනෙහි දායාදය ලැබූවෙක් දැයි" ධර්මාශෝක

මහරජු මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගෙන් විමසා සිටියේය.

එකල්හී මහරහතන් වහන්සේ ධර්මාශෝකයන්ගේ පුත්‍ර වූ මිහිඳු කුමරාගේත්, දියණිය වූ සංඝමිත්තා කුමරියගේත් නිවන් අවබෝධය පිණිස සසරෙහි රැස්කරන ලද මහා පින් බලය දැක, ඔවුන් විසින් අනාගතයෙහි ගෞතම බුද්ධ ශාසනය බබළවන බවත් දැක, ඒ ශාසනභාරධාරී මහතෙරණුවෝ ධර්මාශෝක රජු හට මෙය වදාළහ.

"මහරජතුමනි, ඔබ මහා ත්‍යාගවන්තයෙකි. එනමුදු උතුම් බුද්ධ ශාසනයෙහි දායාදය ලැබූවෙක් නොවේ. ඔබ සිව්පස පුදන දායකයෙක් පමණි. මහරජුනි, යමෙක් වනාහී තමන්ගේ පුත්‍රයෙකු හෝ දියණියක හෝ බුදු සසුනෙහි පැවිදි කරන්නේ නම් ශාසන දායාදය ලැබූවෙක් වන්නේ ඔහු ය. හුදෙක් සිව්පස දායකයෙක් වූ අයෙක් සසුන් දායාදයකට හිමිකරුවෙක් නොවන්නේය."

මෙවදන් ඇසූ ධර්මාශෝක නිරිඳුන් හට ගෞතම බුද්ධ ශාසනයෙහි දායාදය ලැබීමට මහත් ආසාවක් ඇතිවූයේය. මිහිඳු රාජපුත්‍රයාත් සංඝමිත්තා රාජදියණියත් කැඳවා මෙය ඇසුවේය.

"කිම.... මාගේ දරුවෙනි, තෙපි පැවිදි වන්නහු ද? බුදු සසුනෙහි පැවිද්ද වනාහී ඉතා උත්තම දෙයකි." පියරජුගේ වචනය ඇසූ දරුවෝ මෙසේ පිළිතුරු දුන්හ. "දේවයන් වහන්ස, ඔබවහන්සේ කැමති වන සේක් නම් අපි අද වුනත් පැවිදි වෙන්ට කැමති වෙමු. ගෞතම බුදු සසුනේ පැවිදි බව ලැබීමෙන් අපටත් ඔබවහන්සේටත් වන්නේ මහත් ලාභයකි."

# මිහිඳු කුමරුගේ පැවිද්ද

සිය සුළුපියාණන් වූ තිස්ස යුවරජු ධර්මාශෝක රජුගෙන් අවසර ගෙන කලින් ම පැවිදි බවට පත්වූයේය. ඒ හේතුවෙන් මිහිඳු කුමරු ද පැවිදි වීමෙහි බලවත් අපේක්ෂාවකින් පසුවිය. එසෙයින් ම සංඝමිත්තා කුමරියගේ ස්වාමියාව සිටි අග්ගිබ්‍රහ්ම කුමාරයා ද පැවිදි බවට පත්වූ බැවින් සංඝමිත්තාවන්ගේ සිතෙහි ද වූයේ පැවිදි වීමේ අපේක්ෂාව යි.

ධර්මාශෝක රජු තිස්ස යුවරාජයන්ගේ පැවිද්ද නිසා හිස් වූ යුවරාජ පදවිය මිහිඳු කුමරුට පවරන්නට කැමති වූ නමුත් මිහිඳු කුමරුගේ පැවිද්ද ගැන වඩාත් ම සතුටු වූවේය. බුද්ධි බලයෙන් හා රූප බලයෙන් ද බබළන මිහිඳු නමැති ප්‍රිය පුත්‍රයාත් සංඝමිත්තා රාජදියණියත් මහත් ගරු සත්කාර සහිතව ගෞතම බුදු සසුනෙහි පැවිදි කරවන ලද්දාහ.

අපගේ මිහිඳු කුමරුගේ පැවිදි වීමත් උපසම්පදා වීමත් එකම දිනයකදී සිදුවිය. සංඝමිත්තාවට ද පැවිද්ද සමග සික්ඛමානාවක් ලෙසින් ශික්ෂාපද සමාදන් වීම ද එදින ම ලැබුණි.

මිහිඳු කුමරු පැවිදි වන විට උපාධ්‍යායන් වහන්සේ වූවෝ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ය. මහාදේව තෙරුන් වහන්සේ කුමරු පැවිදි කළහ. මජ්ඣන්තික තෙරුන් වහන්සේ උපසම්පදා කර්ම වාක්‍යය පැවසූහ. ඒ උපසම්පදා මාලකයෙහිදී මිහිඳු නමැති නවක උපසම්පදාලාභී භික්ෂුව සතර පටිසම්භිදාලාභී මහරහත් භික්ෂුවක් බවට පත්විය.

සංඝමිත්තාවන් පැවිදි වන විට ඇයගේ උපාධ්‍යාය භික්ෂුණිය වූවා ධම්මපාලා තෙරණිය ය. ඇයගේ ආචාර්ය භික්ෂුණිය ආයුපාලී තෙරණිය යි. ඒ සංඝමිත්තාවෝ කිහිප දිනකින් උතුම් අර්හත්වයට පත්වූවාය.

## මිහිඳු මහරහතන් වහන්සේ ධර්මය වනපොත් කරති.

මිහිඳු මහරහතන් වහන්සේත් සංඝමිත්තා රහත් භික්ෂුණියත් යන දෙදෙනා වහන්සේ ම ලංකාවෙහි බුද්ධ ශාසනය බබුළුවන්නට බොහෝ සේ උපකාරී වූ සේක. මෙතුමන් වහන්සේලා පැවිදි වෙද්දී ධර්මාශෝක රජු රාජාභිෂේකය ලබා වසර හයකි.

ලංකාද්වීපය ම බුදු සසුනෙහි පහන් බවට පත්කළ දීපප්පසාදක වූ මිහිඳු මහරහතන් වහන්සේ පැවිදි උපසම්පදාව ලබා තුන් අවුරුද්දක් සම්පූර්ණ වන විට සිය උපාධ්‍යාය වූ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ වෙතින් තුන් පිටකය මැනවින් කටපාඩම් කරගත් සේක. එකල සංඝමිත්තා භික්ෂුණිය සඳරේඛාවක් සෙයින් ද මිහිඳු භික්ෂුව හිරු මඬලක් සෙයින් ද සසුන් ගගන තලයෙහි දිලිහී ගියහ.

අන්‍ය තීර්ථකයන් පැවිදි බව ලබා සසුන් අර්බුදය බිහිකළ වකවානුවෙහි ධර්ම සංගායනාවට කල් එළඹෙන තුරු මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ තමන් යටතේ සිටි සඟපිරිස පවරන ලද්දේ මිහිඳු මහරහතන් වහන්සේට ය. ලක්දිවට වඩිනා තුරු අප මිහිඳු මහරහතන් වහන්සේ සඟරුවනට අතිශයින් උපකාරී වූ සේක.

# ධර්මදූත සේවය පිණිස රටවල් නවයකට සංඝයා පිටත් කිරීම

ගෞතම සම්බුදු සසුන බැබළවූ අපගේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ තුන්වන ධර්ම සංගායනාව සමාප්ත කොට අනාගතයේ බුදු සසුන පිහිටන්නේ කවර ප්‍රදේශවලදැයි නුවණින් බැලූ සේක. එකල්හී උන්වහන්සේට වැටහී ගියේ ඈත පිටිසර රාජ්‍යයන්හි බුදු සසුන පිහිටන බවයි. තෝරාගත් ඒ ඒ ප්‍රදේශවලට ඒ ඒ රහතන් වහන්සේලා බුදු සසුන පිහිටුවීම පිණිස පිටත් කරවන ලද්දාහ.

කාශ්මීර ගන්ධාර (වර්තමාන ඇෆ්ගනිස්ථාන්) රටට මජ්ඣන්තික මහරහතන් වහන්සේ ද, මහිස මණ්ඩලයට මහාදේව මහරහතන් වහන්සේ ද, වනවාස ප්‍රදේශයට රක්ඛිත මහරහතන් වහන්සේ ද, අපරන්ත ප්‍රදේශයට යෝනක ධම්මරක්ඛිත මහරහතන් වහන්සේ ද, මහාරාෂ්ට්‍ර ප්‍රදේශයට මහා ධම්මරක්ඛිත මහරහතන් වහන්සේ ද, යෝනක රට හෙවත් ග්‍රීකයන් වසන රටට මහා රක්ඛිත මහරහතන් වහන්සේ ද, හිමාල ප්‍රදේශයට මජ්ඣිම මහරහතන් වහන්සේ ද, සුවණ්ණභූමි රටට සෝණ සහ උත්තර යන මහරහතන් වහන්සේලා ද පිටත් කොට යවන ලද්දාහ.

මිහිඳු මහරහතන් වහන්සේ ඇතුලු තම ශිෂ්‍ය භික්ෂූන් වන ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල නමැති රහතන් වහන්සේලා අමතා "ඔබවහන්සේලා ඉතා රම්‍ය වූ ලංකාද්වීපයට වැඩම කොට ඉතා සොඳුරු වූ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය පිහිටුවන්ට ඕනෑ" ය කියා එකී මහරහතන් වහන්සේලා පිටත් කොට යවන ලද්දාහ.

එකල්හී මහා නුවණැති මිහිඳු මහරහතන් වහන්සේ උපසම්පදාව ලබා දොළොස් වසරකි. උපතින් තිස් දෙවසරකි.

## වේදිසගිරි හෙවත් සාංචියට වැඩම කිරීම

මිහිඳු මහරහතන් වහන්සේ ගෞතම බුදු සසුන කෙරෙහි ලංකාද්වීපවාසීන් පහදවනු පිණිස සුදුසු කල් බලා සිටි සේක. 'ලංකාවෙහි දැන් සිටින මුටසීව රජු ඉතා මහලු ය. ඔහුගේ පුත්‍ර වූ දේවානම්පියතිස්ස කුමරු ඊළඟට ලංකාවෙහි රජ බවට පත්වේවා!' යි අධිෂ්ඨාන කළ සේක.

ලංකා රාජ්‍යයෙහි අලුත් රජෙක් බිහිවෙන තුරු ඒ කාලය අතර සිය ඥාතීන් දකින්නට අදහස් කළ මිහිඳු මහරහතන් වහන්සේ උපාධ්‍යායන් වහන්සේත් සඟරුවනත් වැඳ අවසර ගෙන සිය පියාණන් වූ ධර්මාශෝක මහාධිරාජයාටත් දැනුම් දුන් සේක. ඉක්බිති ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහත් භික්ෂූන් සතර නමත්, ෂඩ්භිඥාලාභී සුමන නමැති මහා ඉර්ධිමත් සාමණේර රහත් නම ද කැටුව ඥාති සංග්‍රහය පිණිස රජගහ නුවර සිට දක්ඛිණාගිරි ජනපදයට වැඩි සේක. ඉල් මස සිට බක් මස දක්වා පාගමනින් වැඩි ඒ ගමනට හය මාසයක් ගත විය.

සිය මෑණියන් වූ දේවී කුමාරියගේ නගරය වන වේදිසගිරියට වැඩි සේක. එකල්හී මව් දේවිය සිය පුත්‍රයන් වහන්සේ ඇතුලු සඟ පිරිස මහත් ගෞරවයෙන් පිළිගත්තාය. ප්‍රණීත දන්පැන් වළඳවා තමන් විසින් කරවන ලද සොඳුරු වේදිසගිරි විහාරය පිහිටි පර්වතයට වැඩම කරවූහ.

ඒ වේදිසගිරි විහාරය අද හඳුන්වන්නේ සාංචිය යන නමිනි. අපගේ මිහිඳු මහරහතන් වහන්සේ වැඩවිසූ කුටිය අදටත් එහි ඇත්තේය.

# මිහිඳු මහරහතන් වහන්සේගේ අධිෂ්ඨානයන්

මිහිඳු මහරහතන් වහන්සේ විසින් අධිෂ්ඨාන කරන ලද සියලු කරුණු ඒ අයුරින් ම සිදුවූයේය. වේදිසගිරියෙහි වැඩහුන් උන්වහන්සේ මෙසේ අධිෂ්ඨාන කොට වදාළ සේක.

"මාගේ පියරජුගේ මෙහෙයවීමෙන් දෙවනපෑතිස් මහරජුට සිදුකෙරෙන දෙවෙනි අභිෂේකෝත්සවය ඒ අයුරින් ම සිදුවේවා! පියරජු විසින් යවන දූතයන්ගෙන් තුනුරුවන්ගේ ගුණ ඒ රජතුමා අසා දැනගනීවා! ලබන පොසොන් පොහෝ දා ඒ දෙවනපෑතිස් රජු ලක්දිව අනුරපුරයේ මිස්සක පව්වට නගීවා! එදවසෙහි ම අපිදු උතුම් ලංකාද්වීපයට යන්නෙමු."

එකල්හී සක්දෙව් රජු අපගේ මිහිඳු මහරහතන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියේය. "ස්වාමීනී, ලංකාවාසීන් උතුම් බුදු සසුනෙහි පැහැදවීම පිණිස එහි වඩිනු මැනව. ඔබවහන්සේ විසින් ලක්දිව බුදු සසුන පිහිටුවන බවට අපගේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පානා අවස්ථාවේදී වදාළ සේක. බුදු සසුන කෙරෙහි ලක්දිව පහදවාලීමට අපිදු ඔබවහන්සේලාට උපකාරී වන්නෙමු."

මිහිඳු මහරහතන් වහන්සේගේ මෑණියන්ගේ සොයුරියගේ දියණියකට භණ්ඩුක නමින් පුත් කුමරෙක්

සිටියේය. මිහිඳු මහරහතන් වහන්සේ සිය මෑණියන් වූ දේවී කුමාරියට වදාළ ධර්මයට සවන් දුන් භණ්ඩුක කුමාරයා අනාගාමී ඵලයට පත්ව අපගේ මහරහතන් වහන්සේ ළඟ ම වාසය කළේය.

## උත්තම ශ්‍රී මහින්දාගමනය

මිහිඳු මහරහතන් වහන්සේ වේදිසගිරියෙහි වාසය කොට පොසොන් පුර පසළොස්වක් පොහෝ දිනෙක සිය ශිෂ්‍ය භික්ෂූන් රහත් සතර නමත් සුමන නමැති රහතන් වහන්සේත් භණ්ඩුක උපාසකත් කැටුව ඥාතීන් කෙරෙහි කිසිදු බැඳීමක් නැතිව වේදිසගිරි විහාරයෙන් අහසට පැන නැංග සේක. ඒ ගමනට භණ්ඩුක උපාසක කැඳවාගත්තේ තමන් මනුෂ්‍යයන් බව ලංකාවාසීන්ට පෙන්වාදීම පිණිස යි. එදා ඒ පිරිවර සමගින් මිහිඳු මහරහතන් වහන්සේ අපගේ ලංකාද්වීපයට වැඩම කොට මිස්සක පව්වෙහි ඉතා සිත්කලු උතුම් වූ අම්බස්ථලයෙහි වැඩසිටි සේක.

## මුව දඩයමේ ගිය දෙවනපෑතිස් රජු

එවකට අප රටෙහි රජු වූ දෙවනපෑතිස් නිරිඳු ඒ පොසොන් පොහෝ දා අනුරපුර නගරවාසීන්ට ජල ක්‍රීඩෝත්සව කරන්නට නියම කළේය. එසේ නියම කොට තමා මුව දඩයමට ගියේය. පාගමනින් දුවගෙන යන ඒ ගමනට සතළිස් දහසක් මිනිස්සු පිරිවර වූහ. එකල්හී ඒ පර්වතයෙහි අධිගෘහිත දේවතාවෙක් රහතන් වහන්සේලාව රජතුමාට පෙන්වාදීම පිණිස ගෝණෙකුගේ වේශයක් මවාගෙන තණ පඳුරක් කමින් සිටින ආකාරයක් පෙන්නුම් කළේය.

ගොදුරු කන නිසාවෙන් වටපිට බලන්නට ප්‍රමාද වී සිටි සතෙකුට ඊතලයෙන් විදීම නුසුදුසු යැයි සිතූ දෙවනපෑතිස් රජු දුන්නේ ලණුව ගස්සා ශබ්ද කළේය. ගෝණා පර්වතය දෙසට පැන දිව්වේය. රජු සතා ලුහුබැඳ ගියේය. ගෝණා රහතන් වහන්සේලා වැඩසිටි තැනට ගොස් නොපෙනී ගියේය.

එකල්හී මිහිඳු මහරහතන් වහන්සේ තමන් වහන්සේව පමණක් පෙනෙන්නට අදිටන් කළ සේක. එසේ අදිටන් කරන ලද්දේ අහඹු ලෙස පැවිදි බොහෝ දෙනෙකුව එක්වර දකින්නට ලැබුණහොත් රජතුමා බියට පත්වේවි යන කරුණ නිසා ය.

රජතුමා රහතන් වහන්සේව දුටු පමණින් බියට පත්වූයේය. එවිට අපගේ මිහිඳු මහරහතන් වහන්සේ "තිස්සයෙනි, එන්න" කියා වදාළ සේක. 'තිස්සයෙනි' කියා රජු හට නමින් කතා කළ නිසාවෙන් රජු සිතුවේ මේ නම් යක්ෂයෙකි කියා ය.

## ඔබ කවුරුන් ද? අපි ධර්මරාජයන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු.

"මහරජුනි, අපි ශ්‍රමණයෝ වෙමු. ධර්මරාජයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ය. ඔබ කෙරෙහි අනුකම්පාවෙන් ම ජම්බුද්වීපයේ සිට මෙහි පැමිණියෙමු." මෙය ඇසූ රජුගේ සිතෙහි භය නැති වූයේය. සිය මිත්‍ර දම්සෝ නිරිඳුන් විසින් එවන ලද හසුනෙහි තිබූ කරුණ මතකයට පැමිණියේය. මේ වනාහී ඒ ශ්‍රමණයෝ ම ය කියා නිශ්චයකට පැමිණියේය.

මානාගෙන සිටි ඊතල පසෙකට ලූ දෙවනපෑතිස් රජු මිහිඳු මහරහතන් වහන්සේ වෙත පැමිණියේය. උන්වහන්සේ සමග කතාබස් කොට ළඟින් වාඩිවූයේය. එසැණින් රජුගේ පුරුෂයෝ අවුත් වටින් පිරිවරා ගත්හ. අප මහරහතන් වහන්සේ ද තමන් සමග පැමිණි ඉතිරි සයදෙනා පෙනෙන්නට සැලැස්වූ සේක.

ඒ පිරිස දුටු රජතුමා "මේ පිරිස ආවේ කවදා ද?" යි ඇසුවේය. "මේ පිරිස ද මා සමග පැමිණියේය."

"මෙබඳු යතිවරයන් වහන්සේලා තවත් දඹදිව සිටිත් ද?" "එසේය මහරජුනි, දඹදිව කසාවත් පෙරවූ මෙබඳු ශ්‍රමණයන්ගෙන් බබළයි. ත්‍රිවිද්‍යාලාභී, මහා ඉර්ධිමත් රහතුන්ගෙන් පිරී තිබේ."

"එතකොට ඔබවහන්සේලා මෙහි වැඩියේ කුමකින් ද?" "මහරජුනි, අපි ගොඩබිමින් නොආවෙමු. දියෙනුත් නොආවෙමු." එකල්හී එසේ නම් මුන්වහන්සේලා අහසින් වැඩියාහුය යි රජු තේරුම් ගත්තේය.

කරුණු කාරණා විමංසනයෙහි රජුගේ ඥාණවන්ත භාවය විමසීම පිණිස මිහිඳු මහරහතන් වහන්සේ ඔහුගෙ න් ප්‍රශ්න අසා වදාළහ. රජතුමා ද ඒ ඇසූ ඇසූ සැම ප්‍රශ්නයකට ම නිසි පිළිතුරු දුන්නේය.

## අඹ පැනය

"රජතුමනි, මේ වෘක්ෂයේ නම කුමක්ද?" "මේ වෘක්ෂය අඹ නම් වේ."

"මේ අඹරුක හැර තවත් අඹ ගස් තිබේ ද?" "එසේය. තව බොහෝ අඹ ගස් ඇත්තේය."

"මේ අඹ ගසත් හැර ඒ අඹගසුත් හැර තවත් වෘක්ෂයෝ තිබෙත් ද?" "එසේය. බොහෝ වෘක්ෂයෝ තිබෙති. හැබැයි ඒවා අඹ නොවේ."

"ඒ අඹගසුත් අඹ නොවන ගසුත් අත්හළ විට වෙනත් ගස් තිබේද?" "ඇයි ස්වාමීනී, මේ අඹ රුක..!"

"මහරජුනි, තොප නුවණැත්තෙකි."

## ඥාති ප්‍රශ්නය

"මහරජුනි, තොපට නෑයෝ සිටිත් ද?" "එසේය. බොහෝ නෑයෝ සිටිති."

"රජතුමනි, නොනෑයෝ සිටිත් ද?" "එසේය. නොනෑයෝත් බොහෝ සිටිති."

"රජතුමනි, ඒ නෑයෝත් නොනෑයෝත් අත්හළ විට තව කවුරුවත් සිටිත් ද?" "ඇයි ස්වාමීනී, මම..!"

"මැනවි රජතුමනි, තෙපි නුවණැතියෙකි."

## දෙවනපෑතිස් රජු තෙරුවන් සරණ යයි.

මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජු නුවණැතියෙක් බව වටහා ගත් සේක. නුවණැත්තෙකුට ම හොබනා වූ චූළහත්ථිපදෝපම සූත්‍රය ඔහුට දේශනා කළ සේක. ඒ දෙසුම අවසානයෙහි පිරිවර සතළිස් දහසක් සමග දෙවනපෑතිස් රජු උතුම් තෙරුවන් සරණෙහි පිහිටියේය.

ඒ සවස් යාමයෙහි වැළඳිය යුතු රාජ භෝජන පිළියෙල කොට රජු වෙතට ගෙන එන ලදී. චූළ

හත්ථිපදෝපම සූත්‍රයෙහිදී භාග්‍යවතුන් වහන්සේ වදාළ පරිදි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක ශ්‍රමණවරු විකාල භෝජන නොවළඳන්නාහ යි රජතුමා දන්නේය. නමුත් මේ පිරිස ආගන්තුක නිසාවෙන් ඇසීම යුතුමක් යැයි සිතා දැන් බත් වළඳින සේක් දැයි අසා සිටියේය. "රජතුමනි, දැන් අප බත් වළඳින වේලාව නොවේ" කියා මහරහතන් වහන්සේ පිළිතුරු දුන් සේක.

එකල්හී දෙවනපෑතිස් රජු භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාට දන් වැළඳීමේ කැප වේලාව ගැන උන්වහන්සේගෙන් විස්තර වශයෙන් අසාගත්තේය.

"එසේ නම් ස්වාමීනී, අපි නගරයට යමු නේද?" "රජතුමනි, ඔබ යනු මැනව. අපි මෙහි ම වාසය කරන්නෙමු." "එසේ නම් මේ කුමාරයා අප සමග යන්ට පැමිණේවා!" "රජතුමනි, මේ කුමරු බුදු සසුන ගැන මැනවින් දන්නා කෙනෙකි. දැන් සිටින්නේ පැවිදි වීමේ අපේක්ෂාවෙනි. අපි දැන් මොහුව පැවිදි කරන්නෙමු. එනිසා රජතුමනි, ඔබතුමා යනු මැනව."

"එසේ නම් ස්වාමීනී, හෙට උදෑසන රථය එවන්නෙමි. නුඹවහන්සේලා ඒ රථයෙන් නගරයට වඩිනු මැනව." කියා දෙවනපෑතිස් රජු මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට වන්දනා කොට භණ්ඩුක කුමාරයාව පසෙකට කැඳවා ගත්තේය. මිහිඳු මහරහතන් වහන්සේ පිළිබඳ විස්තර ඇසුවේය. කුමාරයා සියලු විස්තර පැහැදිලි කර දුන්නේය. මිහිඳු මහරහතන් වහන්සේ හා ධර්මාශෝක රජුන් සමග ඇති සම්බන්ධය ද දැනගත් දෙවනපෑතිස් රජු සිය රටවාසීන් හට එයින් යහපත වන බව දැන අතිශයින් ම සතුටට පත්වූයේය.

## ලක්දෙරණෙහි පළමුව රහත් වූ සේක් භණ්ඩුක මහරහතන් වහන්සේ ය.

මිහිඳු මහරහතන් වහන්සේ ඒ ගම් සීමාවේදී ඒ සඟපිරිස අතරදී ම භණ්ඩුක කුමාරයා පැවිදි කළ සේක. උපසම්පදා කළ සේක. පැවිදි උපසම්පදාව ලද සැණින් භණ්ඩුකයන් වහන්සේ අර්හත්වයට පත්වූ සේක.

## සුමන රහතන් වහන්සේ දෙවියන්ට බණ ඇසීමට ඇරයුම් කරති.

එකල්හී අපගේ මිහිඳු මහරහතන් වහන්සේ සුමන සාමණේරයන් අමතා වදාළ සේක. "සුමනයෙනි, දැන් බණ ඇසීමට කාලය යි. එය හඬ නගා දැනුම් දෙව." "ස්වාමීනී, කොපමණ දුරක් දක්වා හඬ නගා අස්වන්ට ද?" "මුළු තම්බපණ්ණියට ම ඇසෙන්ට හඬ නගව." එකල්හී සුමන සාමණේරයන් වහන්සේ සිය ඉර්ධි බලයෙන් මුළු ලක්දිවට ඇසෙන සේ හඬ නගා බණ ඇසීමට කාලය දැනුම් දුන්හ.

එවිට ඊට බටහිර පැත්තේ නාග පොකුණ අසළ වාඩිවී බොජුන් වළඳමින් සිටි දෙවනපෑතිස් රජුට සුමන සාමණේරයන් ඉර්ධියෙන් කළ ඝෝෂාව ඇසී අපගේ මහරහතන් වහන්සේ වෙත ඇමතියන් යැව්වේය. ඔවුන් ගොස් කිසියම් කරදරයක් දැයි ඇසුවේය. කිසි උපද්‍රවයක් නැති බවත් භාග්‍යවතුන් වහන්සේගේ උතුම් වචනයන් අස්සවන්නට කාලය බව දෙවියන්ට හඬ නගා දැනුම් දීමක් කළ බවත් අප මහරහතන් වහන්සේගෙන් පිළිතුරු ලැබුණි.

## බොහෝ දෙවිවරු මගඵල ලබති.

සාමණේරයන් වහන්සේගේ දැනුම් දීම ඇසූ භූමාටු දෙවිවරු ද එය ම හඬ නගා දැනුම් දුන්හ. මෙසේ අනුක්‍රමයෙන් දැනුම්දීමේ ශබ්දය බඹලොව දක්වා පැතිර ගියේය. එකල්හී මහා දෙව් පිරිසක් රැස්වූහ. ඒ රැස්වූ මහා දෙව් පිරිසට අපගේ ධර්ම සේනාධිපතීන් වහන්සේ විසින් වදාරන ලද දෙසුමක් වන සමචිත්ත පරියාය සූත්‍රය මුල්කොට මිහිඳු මහරහතන් වහන්සේ දහම් දෙසූ සේක.

බොහෝ දෙවිවරු බණ අසා මගඵල ලැබූහ. දිව්‍ය නාග, දිව්‍ය ගරුඬ ආදී සත්වයෝ ද තෙරුවන් සරණේ පිහිටියාහ. සාරිපුත්තයන් වහන්සේ සමචිත්ත පරියාය සූත්‍ර දේශනාව වදාළ අවස්ථාවෙහි රැස්වූ දෙව් පිරිස සෙයින් එදා අම්බස්ථලයෙහිදී ද බොහෝ දෙව් පිරිස් රැස්වූහ.

## සිල් සුවඳ පැතිරවූ මහරහතන් වහන්සේලා

පසුවදා දෙවනපෑතිස් රජු තෙරුන් වහන්සේලා වැඩමවීමට රථය පිටත් කළේය. රියදුරා එතැනට ගොස් රථයට ගොඩවනු මැනව කියා කී කල්හි "අපි රථයට ගොඩනොවෙන්නෙමු. ඔබ යනු මැනව. අපි පසුව එන්නෙමු" කියා රියදුරාව පිටත් කොට අපගේ ඉර්ධිමත් රහතන් වහන්සේලා අහසට පැන නැංග සේක. නගරයට නැගෙනහිරින් පොළොවට බැස්ස සේක. ඒ ස්ථානයට පඨමක චෛත්‍යය යැයි කියනු ලැබේ.

දෙවනපෑතිස් රජුගේ අන්තඃපුරයෙහි බිසෝවරුන්ට ද රජුගෙන් මිහිඳු මහරහතන් වහන්සේගේ ගුණ අසන්නට

ලැබුණේය. ඔවුන්ට ද තෙරුන් වහන්සේලා බැහැදැකීමේ කැමැත්ත ඇති විය. රජ තෙමේ රාජ මන්දිරය තුළ රම්‍ය වූ මණ්ඩපයක් කරවා සුදු වත් අතුරා මලින් සරසවා බොහෝ වටිනා සුඛෝපභෝගී ආසන පිළියෙල කළේය. මාළිගාවෙහි ඇති උසස් ආසනවල තෙරුන් වහන්සේලා වැඩහිඳිත් දෝ හෝ යි සැකයෙන් පසුවූයේය.

රියදුරා රථය ආපසු පදවාගෙන එද්දී පඨමක චෛතිය පිහිටි තැන වැඩහුන් තෙරුන් වහන්සේලා නගරයට වඩිනු පිණිස දෙවුර වසා සිවුර පොරවනු දැක අතිශයින් විස්මයට පත්වූයේය. තෙරුන් වහන්සේලා රථයෙන් නොවැඩි බවත් තමා එන්ට පෙර ම වැඩමවා ඇති බවත් රජුට දැනුම් දුන්නේය. එය ඇසූ රජතුමා රාජකීය පුටුවල උන්වහන්සේලා අසුන් නොගනිත් යැයි සැක කළේය.

## අසුන් පැනවීමේ නිමිත්ත

"එසේ නම් යහපත් ආකාරයෙන් බුමුතුරුණු එළා අසුන් පනවව" කියා රජු නියෝග කළේය. රහතන් වහන්සේලා පිළිගැනීමට පෙරගමන් කොට ආදරයෙන් වන්දනා කොට මිහිඳු මහරහතන් වහන්සේගේ අතින් පාත්තරය ගත්තේය.

තෙරුන් වහන්සේලා උදෙසා රජගෙදර පනවා ඇති ආසන දුටු නිමිතිකරුවෝ මෙසේ කීහ. "මුන්වහන්සේලා විසින් මේ මහපොළොව ගන්නා ලදී. මුන්වහන්සේලා ලංකාවෙහි ස්වාමිවරු බවට පත්වන්නාහ" යනුවෙනි. රජ්ජුරුවෝ රහතන් වහන්සේලාට ගරුසරු දක්වමින් වඩමවා අවුත් ආසනවල වැඩහිඳුවාලූහ.

# ලක්වැසි පිනැතියන් මගඵල ලැබූ පළමු දෙසුම

එදින දන් වැළඳීමෙන් පසු මිහිඳු මහරහතන් වහන්සේ දහම් දෙසූ සේක. ඒ දහම ඇසීමට රජුගේ බාල සොහොයුරෙකු වන මහානාග යුවරජුගේ බිසව වන අනුලා දේවිය ප්‍රමුඛ පන්සියයක් කාන්තාවෝ පැමිණ වාඩිවී සිටියහ.

මිහිඳු මහරහතන් වහන්සේ පව් කොට දුක් විඳින සත්වයන්ගේ විස්තර ප්‍රේතවස්තුවෙනුත්, පින් කොට දෙව්ලොව ඉපිද සැප විඳින සත්වයන්ගේ විස්තර විමානවස්තුවෙනුත් වදාළ සේක. සසර දුක අවසන් කිරීමට ඇති එක ම උපාය චතුරාර්ය සත්‍යාවබෝධය බව පෙන්වාදීම පිණිස සච්ච සංයුත්තය වදාළ සේක. ඒ දෙසුම අවසානයෙහි සියලු කාන්තාවෝ සෝවාන් ඵලයට පත්වූහ.

## පොදු ජනයා ද මගඵල ලබයි.

රහතන් වහන්සේලාගේ ගුණ සුවඳ අනුරපුරය සිසාරා විහිද ගියේය. නුවරවැස්සෝ මිහිඳු මහරහතන් වහන්සේ බැහැදකින්නට රැස්වෙන්ට පටන් ගත්හ. රාජ දොරටුව අබියසට පැමිණි ඔවුහු ඝෝෂා කළහ. එකල්හී දෙවනපෑතිස් රජු නගරවාසීන්ට බණ ඇසීම පිණිස ඇත්හල සෝදවා, උඩුවියන් බඳවා, සරසවා සංඝයාට ගැලපෙන අයුරින් ආසන පනවන ලද්දේය. එකල්හී මිහිඳු මහරහතන් වහන්සේ දේවදූත සූත්‍රය වදාළ සේක. දම් දෙසුම අවසානයෙහි ඒ පැමිණ සිටි පිරිස අතුරින් දහසක් දෙනා සෝවාන් ඵලයට පත්වූහ. මේ දෙසුම්වලදී මිහිඳු

මහරහතන් වහන්සේ ධර්මය විස්තර කොට වදාළේ දීප භාෂාවෙනි.

## නැවතත් ජනයා මගඵල ලබයි.

පිළියෙල කරගත් ඇත්හලෙහි ද පැමිණෙන්නා වූ ජනයාට ඉඩකඩ මදි විය. එකල්හී දෙවනපෑතිස් රජු සිහිල් සෙවන ඇති නන්දන වනයෙහි රහතන් වහන්සේලා උදෙසා අසුන් පනවන ලදී. නගරවාසී කුලකාන්තාවෝ බණ ඇසීමට රැස්වූහ. මිහිඳු මහරහතන් වහන්සේ බාලපණ්ඩිත සූත්‍රය වදාළ සේක. දහම් ඇසූ දහසක් කාන්තාවෝ සෝවාන් ඵලයට පත්වූහ.

## මහමෙව්නා උයන බුදු සසුනට පිදේ.

නන්දන වනයේ ගත කරද්දී සවස් වී ගියේය. රහතන් වහන්සේලා යළිත් මිස්සක පව්ව දෙසට වඩින්නට සූදානම් වූහ. දෙවනපෑතිස් රජු වහා පැමිණියේය.

"ස්වාමීනී, දැන් සවස් වී ඇත්තේය. පර්වතයට සැහෙන්ට දුර ද ඇත්තේය. මේ නන්දන වනෝද්‍යානයෙහි ගතකිරීම පහසු නොවේ ද?" "මහරජ, මෙය නගරයට ඉතා ආසන්න ය. පැවිද්දන් වූ අපට නුසුදුසු ය." "එසේ නම් ස්වාමීනී, මහමෙව්නා උයන වනාහී නගරයට දුර ද නැත. ළඟ ද නැත. රම්‍ය සෙවණින් යුක්ත ය. මිහිරි ජලයෙන් යුක්ත ය. ඔබවහන්සේලා එහි විසීමට රුචි වෙත්වා! එහි නැවතුන මැනව."

එකල්හී අපගේ මිහිඳු මහරහතන් වහන්සේ මහමෙව්නා උයනෙහි නවාතැන් ගත් සේක. උන්වහන්සේලා නැවතී සිටියාහු කොළොම් ගඟ අසබඩ ය. එතැන හඳුන්වන්නේ 'නිවත්තක චේතිය' යන නමිනි.

පසුවදා උදෑසන රජතුමා මල් ගෙන්වාගෙන ඇවිත් රහතන් වහන්සේලා වන්දනා කොට මලින් පූජා පැවැත්තුවේය. "කිම ස්වාමීනී, සැපසේ වාසය කළාහු ද? මහමෙව්නා උයන පහසු තැනක් ද?" "එසේය රජතුමනි, සැපසේ වාසය කළෙමු. මහමෙව්නා උයන ශ්‍රමණයන් වහන්සේලාට පහසුවෙන් වාසය කළ හැකි තැනකි."

"ස්වාමීනී, සංඝයා වහන්සේට ආරාම පිළිගැනීම කැප ද?" "මහරජුනි, භාග්‍යවතුන් වහන්සේ සංඝයා වහන්සේට ආරාම පිළිගැනීමට අවසර දුන් සේක." කැප අකැප දේ පිළිබඳ වටහාගැනීමෙහි දක්ෂ වූ මිහිඳු මහරහතන් වහන්සේ අප භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර බිම්බිසාර මහරජුගේ වේළුවනය පිළිගත් කතාව දෙවනපෑතිස් රජුට පැහැදිලි කළ සේක.

එකල්හී දෙවනපෑතිස් රජු රන් කෙණ්ඩිය ගෙන "මේ මහමෙව්නා උයන සංඝයාට පූජා කරමි" යි කියා මිහිඳු මහරහතන් වහන්සේගේ අතපැන් වත්කොට පූජා කළේය. ඒ පැන් මිහිතලය මත වැටෙද්දී පොළොව කම්පාවට පත්වූයේය. "කිම... ස්වාමීනී, මහ පොළොව කම්පා වූවා නොවේද?" "එසේය රජතුමනි, ගෞතම බුදු සසුන ලක් පොළෝ තලයෙහි පිහිටියේය.

## අනුලා බිසව පැවිදිබව ඉල්ලයි.

එකල්හී අනුලා බිසව පන්සියයක් ස්ත්‍රීන් සමග පැමිණ අප රහතන් වහන්සේලා වන්දනා කොට සිටියාය. මිහිඳු මහරහතන් වහන්සේ වදාළ දම් දෙසුම අසා ඒ සියල්ලෝ සකදාගාමී ඵලයට පත්වූහ.

පන්සියයක් ස්ත්‍රීන් සමග වූ අනුලා බිසොව දෙවනපෑතිස් රජුට මෙය පවසා සිටියාය. "දේවයන් වහන්ස, අපිත් පැවිදි වීමට කැමැත්තෙමු." රජතුමා මහරහතන් වහන්සේට මෙසේ පැවසුවේය. "ස්වාමීනී, මේ කාන්තාවන් පැවිදි කරන සේක්වා!"

"රජතුමනි, ස්ත්‍රීන් පැවිදි කරන්නට අපට කැප නැත. එසේ නමුදු පාටලීපුත්‍ර නගරයෙහි මාගේ නැගණිය සිටියි. ඕ භික්ෂුණියකි. ධර්ම විනය පිළිබඳ බහුශ්‍රැත තැනැත්තියකි. ඕ නමින් සංඝමිත්තා ය. රජතුමනි, අප භාග්‍යවතුන් වහන්සේගේ විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛා වහන්සේත් රැගෙන එසේම උතුම් භික්ෂුණීන් වහන්සේලා මෙහි වඩිනා සේක්වා! යි අප පියරජු සමීපයට සංදේශයක් යවනු මැනවි. ඒ ස්ථවිරාවෝ මේ කාන්තාවන් පැවිදි කරන්නාහ."

## මිහිඳු මහරහතන් වහන්සේ ලක් මිහිමඬල සොලවති.

දෙවනපෑතිස් මහරජු තමන්ට ලැබුණු පිච්චමල් බඳුනක් මිහිඳු මහරහතන් වහන්සේට පිළිගැන්නුවේය. උන්වහන්සේ එයින් දෝතට මල් ගෙන පහත සඳහන් තැන්වලට දමද්දී මහ පොළොව කම්පාවට පත්විය.

- සංඝයාගේ සීමා මාලකය පිහිටන තැන
- ගිනිහල්ගේ පොකුණ පිහිටන තැන
- ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩසිටින තැන
- උපෝසථාගාරය පිහිටන තැන
- සංඝලාභය බෙදන තැන
- චතුශ්ශාලා නම් වූ සංඝයාට දන් බෙදන තැන

- එමෙන්ම ස්වර්ණමාලී මහසෑ රජුන් පිහිටන තැනදි සපුමල් විසුරුවද්දී මහ පොළොව කම්පා වූයේය.

## මිහිඳු මාහිමියෝ පෙළහර පානා සේක.

මිහිඳු මහරහතන් වහන්සේ අඹ රුක් පහකින් වට වූ පඤ්චම්බ මාලකය නම් වූ තැන වැඩසිටින කල්හි රජතුමාට රන්වන් මිහිරි අඹ ගෙඩියක් ලැබුණේය. රජතුමා විසින් එය මිහිඳු මහරහතන් වහන්සේට පිළිගන්වන ලදී. උන්වහන්සේ එය වැළඳූ සේක.

වළඳා අවසන්හි එම අඹ ඇටය එතැන රෝපණය කරනු පිණිස රජතුමාට දුන් සේක. රජතුමා සියතින් ම අඹ ඇටය රෝපණය කළේය. ඉක්බිති මහරහතන් වහන්සේ ඒ මතට සිය දෝත සේදූ සේක.

අසිරියෙකි! සැණෙකින් අංකුරයක් මතුවිය. කෙමෙන් කෙමෙන් අතුපතර විහිදී ගොස් ගෙඩි පිරී ගිය මහා අඹරුකක් දිස්විය. මේ පෙළහර දුටු රජු සහිත පිරිස විස්මයෙන් ඇලලී ගියහ. එකල්හී මිහිඳු මහරහතන් වහන්සේ එතැනට සමන් මල් අට මිටක් විසිරවූ සේක. මහ පොළොව කම්පා වූයේය. එයට හේතුව ඇසූ කල්හී "රජතුමනි, මේ ස්ථානයෙහි සංඝයාට ලැබෙන බොහෝ ලාභයන් සමගිව රැස්ව පොදුවේ සංඝයා වෙත පූජා කරනු ලබයි."

## රුවන්වැලි මහාසෑ පිහිටන භූමියට තෙරණුවෝ වඩිති.

එහි කකුධ නමින් කුඩා වැවක් තිබුණේය. ඒ අසළ තරමක උස් කඳුගැටයකි. මිහිඳු මහරහතන් වහන්සේ

එතැනට වැඩම කොට සපුමල් අටමිටක් විසුරුවා හළ සේක. සැණෙකින් මහා පෘථිවිය කම්පා වූවාය. රජු විසින් ඒ පෘථිවි කම්පනයෙහි හේතුව අසන ලදී.

එකල්හී මිහිඳු මහරහතන් වහන්සේ මෙසේ වදාළ සේක. "රජතුමනි, මෙතැන මහ පින්බිමකි. පෙර වැඩහුන් කකුසඳ, කෝණාගමන, කාශ්‍යප යන තුන් බුදුවරයන් වහන්සේලා ද ලක්දිව වැඩි ගමනේදී මෙතැනට වැඩි සේක. මෙතැන වැඩහිඳ දන්පැන් වැළඳූ සේක. අප භාග්‍යවතුන් වහන්සේ ද මෙතැනට වැඩම කොට අනාගත සම්බුදු සසුන පිණිස මෙතැනදි නිරෝධ සමාපත්තියෙන් වැඩහුන් සේක. පෙර බුදුවරයන් වහන්සේලා විසින් ම මෙසිරිලක බුදුසසුන පිහිටුවන ලදී. එනමුදු අප භාග්‍යවතුන් වහන්සේ මෙසිරිලක වඩින සමයෙහි මෙහි මිනිස් වාසයක් නොතිබුණේය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේගේ මැදිහත් වීමෙන් බුදුසසුන පිහිටුවීම නොවුනේය.

මහරජ, මෙහි ස්වර්ණමාලී නමින් මහාසෑයක් පිහිටන්නේය. ඒ මහාසෑයෙහි අප භාග්‍යවතුන් වහන්සේගේ ද්‍රෝණයක් සර්වඥ ධාතූන් වහන්සේලා නිධන් කරවන්නාහ. එමෙන්ම ඒ මහාසෑය එක්සිය විසි රියනක් උසට ඉදිවන්නේය."

"එසේ නම් ස්වාමීනී, මම් මැ ඒ මහාසෑය කරවමි." "නැත රජතුමනි, ඔබ විසින් කළයුතු බොහෝ කටයුතු ඇත්තේය. ඔබගේ සොයුරෙකු වන මහානාග යුවරජු හට පුත්කුමාරයෙක් උපදින්නේය. ඔහු යටාලකතිස්ස නමින් රජ වන්නේය. ඒ යටාලතිස්ස රජු හට ගෝඨාභය නමින් පුත් කුමරෙක් උපදින්නේය. ඒ ගෝඨාභය රජ වන්නේය.

ඒ රජුට කාවන්තිස්ස නමින් උපදින පුත් කුමරා රජ වන්නේය. ඒ කාවන්තිස්ස රජුට මහ පිනැති ගාමිණී අභය නමින් පුත් කුමරෙකු උපදින්නේය. හේ මහා තෙදින් යුතු ය. පුණ්‍ය ඉර්ධියෙන් යුතු ය. සූර වීර පරාක්‍රමයෙන් යුතු ය. එකල ලක්දිව පහළවන පරසතු වියවුල් පහකොට මෙතැන්හි රන්මැලි මහාසෑය කරවන්නේය.”

එකල්හී දෙවනපෑතිස් රජු මිහිඳු මහරහතුන්ගේ වචනයන් ගල්ටැඹක ලියවා එතැන පිහිටුවීය.

# මිහිඳු මහරහතන් වහන්සේගේ දෙසුම් අසිරිමත් යැ.

මිහිඳු මහරහතන් වහන්සේට මහමෙව්නා උයනෙහි සාදවා පුදන ලද පළමු විහාරය කාලප්‍රාසාද පිරිවෙණ නමැති තිස්සාරාමය යි. මිහිඳු මහරහතන් වහන්සේ නන්දන වනයෙහි වැඩසිටියදී අග්ගික්ඛන්ධෝපම සූත්‍රයත් ආසිවිසෝපම සූත්‍රයත් වදාළ සේක. දැන් අනුරාධපුරය මගඵලලාභී ශ්‍රාවක උපාසක උපාසිකාවන්ගෙන් පිරුණු නගරයකි.

# අනුරාධපුරයෙහි මහා සීමාව පිහිටුවති.

දිනක් බණ ඇසීමෙන් ලත් දහම් දැනුමෙන් යුතු රජතුමා මිහිඳු මහරහතන් වහන්සේ සමීපයේ හිඳගෙන මෙසේ ඇසුවේය. “ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේගේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය මේ ලංකාද්වීපයෙහි පිහිටියේද?” “රජතුමනි, තවම නොපිහිටියේය. රජතුමනි, සංඝයාගේ විනය පිණිස උපකාරී වන උපෝසථ කර්මාදිය කිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේගේ නියමය

පරිදි මෙහි සීමාවක් බැන්ද යුත්තේය. එකල්හී බුදු සසුන පිහිටන්නේය.” ඒ අනුව මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිව පළමු සීමාව පිහිටුවන ලදී.

## අසිරිමත්ය දම් දෙසුම්

ලක්දිවට වැඩම කොට පස්වන දවසේදී මිහිඳු මහරහතන් වහන්සේ නන්දන වනයට වැඩම කොට බජ්ජනීය සූත්‍රය වදාළ සේක. සයවෙනි දවසෙහි ගෝමයපිණ්ඩූපම සූත්‍රය වදාළ සේක. සත්වෙනි දවසෙහි දම්සක් පැවතුම් සූත්‍රය වදාළ සේක. සතියක් ඇතුලත අනුරාධපුරයෙහි මගඵලලාභී උපාසක උපාසිකාවෝ අටදහස් පන්සියයක් බිහිවූහ. ඒ අසිරිමත් දහම් දෙසුමෙන් බුදු සසුන බැබළුණු නිසාවෙන් නන්දන වනයට ‘ජෝතිවනය’ යන නම ලැබුණි.

ඇසළ මස පුර පක්ෂයේ දහතුන්වෙනිදා අප මහරහතන් වහන්සේ අප්‍රමාද සූත්‍රය මුල්කොට දෙවනපෑතිස් රජුට දහම් දෙසූ සේක.

## මිහිඳු මාහිමියෝ යළි මිස්සක පව්වට වඩිති.

මිහිඳු මහරහතන් වහන්සේ සංඝයා උදෙසා විහාරයක් කරවනු කැමතිව අනුරපුරයෙන් නික්ම සෑගිරියට වැඩි සේක. රහතන් වහන්සේලා සෑගිරියට යන පාරෙන් වඩින බව ඇසූ දෙවනපෑතිස් රජු දේවීන් වහන්සේලා දෙදෙනෙකුත් නංවාගෙන රථයට නැගී රහතන් වහන්සේගේ පියවර සටහන් ඔස්සේ පිටත් වූයේය.

මිහිඳු මහරහතන් වහන්සේ නාගචතුක්ක නමැති විලෙන් පැන්පහසු වී පර්වතයට නගින්නට සූදානම්ව

වැඩහුන් සේක. රජතුමා රථයෙන් බැස රහතන් වහන්සේලාට ආදරයෙන් වන්දනා කොට සිටියේය. එකල්හී මිහිඳු මහරහතන් වහන්සේ මෙසේ ඇසූ සේක. "මහරජුනි, දැන් ග්‍රීස්ම වෙලාවයි. මෙසේ වෙහෙසට පත්ව ආයේ කුමක් නිසා ද?"

"ස්වාමීනී, ඔබවහන්සේ මාහට අප්‍රමාදී බව ගැන දහම් දෙසූ සේක. ආපසු දඹදිව වඩින්ටවත් ද කියා මා හට සැකයක් ඇති විය. මා ආයේ ඒ නිසා ය."

"රජතුමනි, අප මෙහි පැමිණියේ චේතිය පර්වතයෙහි වස් වසන්නට සිතාගෙන ය." මෙසේ වදාළ මිහිඳු මහරහතන් වහන්සේ මහාවග්ගපාළියෙහි සඳහන් වස්සූපනායිකක්ඛන්ධකය විස්තර කොට වස් වැසීම යනු කුමක්දැයි දෙවනපෑතිස් රජුට පහදා දුන් සේක.

## ලක්දිව පළමුවෙන් සිංහල රහතන් වහන්සේලා පහළවන වගයි.

වස් වැසීම පිළිබඳව මිහිඳු මාහිමියන් වදාළ දෙසුම ඇසූ දෙවනපෑතිස් රජුගේ නැගණියගේ පුත්‍රයා වන මහා අරිට්ඨ මහාමාත්‍යතුමා තම සොහොයුරන් පනස් දෙනාත් සමග රජු ඉදිරියේ සිටගත්හ. රජුගෙන් අවසර ගෙන එදින ම මිහිඳු මහරහතන් වහන්සේ වෙතින් ගෞතම බුදු සසුනේ පැවිදි බව ලබාගත්හ.

අසිරියෙකි! සසරෙහි රැස්කළ පින් ඇති ඒ සියලු දෙනා කෙස් රැවුල් බා අවසන් වනවාත් සමග ම ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා බවට පත්වූහ. ඉතා සතුටට පත් දෙවනපෑතිස් රජු හැට දෙනමක් භික්ෂූන් වහන්සේලා

උදෙසා කන්ථක නම් චෛත්‍යස්ථානය වටා ගල්ලෙන් හැටඅටක වැඩකටයුතු ආරම්භ කළේය.

ඇසළ පුන් පොහෝ දා දෙවනපෑතිස් රජු ගල්ලෙන් විහාර පූජාව කළේය. මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ සංඝයා විසින් සෑගිරියටත් තිස් දෙකක් වූ සීමා මාලකයන්ටත් කර්ම වාක්‍යය කියවා සීමා සම්මත කරන ලදී. මහා අරිට්ඨයන් ප්‍රධාන උපසම්පදා අපේක්ෂක නවක භික්ෂූන්ගේ යහපත උදෙසා හැමට පෙර බඳින ලද තුම්බරු නම් සීමා මාලකයෙහිදී උපසම්පදාව ලබාදෙන ලදී. ඒ හැට දෙනමක් වූ සියලු රහතන් වහන්සේලා සෑගිරියෙහි වස් සමාදන් වී රජු හට ධර්මයෙන් සංග්‍රහ කොට වදාළ සේක.

## මිහිඳු මහරහතන් වහන්සේ යළි දඹදිව වඩින්ට සූදානම් වෙති. ඒ භාග්‍යවතුන් වහන්සේව බැහැදැකීම පිණිස යි.

වස් කාලය අවසන් විය. සංඝයා විසින් වස් පවාරණය කරන ලද්දේය. ඉල් පුන් පොහෝ දින උදාවිය. මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජු ඇමතූ සේක. "මහරජුනි, අපගේ ශාස්තෘන් වහන්සේ බැහැදැක වන්දනා කොට දැන් සෑහෙන කලක් ගත විය. මෙහිදී උන්වහන්සේව බැහැදැක වැඳපුදා ගන්නට නැති හෙයින් අපි අනාථවාසයකින් වාසය කරමු. දඹදිව යන්ටයි අදහස."

"ඇයි ස්වාමීනී, ඔබවහන්සේ වදාළේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා වදාළ බව නොවේද?" "එසේය මහරජ, අප භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන්

වහන්සේලා බැහැදැක්ක විට ජීවමාන භාග්‍යවතුන් වහන්සේ දැක්කා හා සමාන ය.”

“මැනවි ස්වාමීනී. මට වැටහී ගියේ ධාතූන් වහන්සේලාට පූජා සත්කාර පිණිස ඔබවහන්සේ ස්තූපයක් කරවීමට අදහස් කරන බවයි. ස්වාමීනී, මං ස්තූපයක් කරන්නෙමි. ධාතූන් වහන්සේලා පිළිබඳව ඔබවහන්සේලා දන්නා සේක්වා!”

## සිරිලක් බිමට සර්වඥ ධාතූන් වහන්සේලා වැඩමවති.

මිහිඳු මහරහතන් වහන්සේගේ මෙහෙයවීම පරිදි සුමන රහතන් වහන්සේ ඉර්ධියෙන් දඹදිවට වැඩියහ. ධර්මාශෝක රජතුමා විසින් වන්දන මානන කළ සර්වඥ බුද්ධ පාත්‍රයත්, එම පාත්‍රය පුරවා උතුම් සර්වඥ ධාතූන් වහන්සේලාත් ලක්දිවට පරිත්‍යාග කරන ලද්දාහ.

සක්දෙව් රජු විසින් තමන් වන්දන මානන කරමින් සිටි සර්වඥ දකුණු අකු ධාතූන් වහන්සේ ලක්දිවට පරිත්‍යාග කරන ලද්දාහ. ඒ අකු ධාතූන් වහන්සේ තැන්පත් කොට ථූපාරාම ස්තූපය ඉදිවූයේය.

සර්වඥ බුද්ධ පාත්‍රය සහිත සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කළ සේක් මිස්සක පව්වේ ය. එනිසා මිස්සක පව්ව චේතියගිරි හෙවත් සෑගිරි යන නමින් හඳුන්වන ලද්දේය.

## ථූපාරාමයේදී පෙළහර දැක සිංහලයෝ තිස්දාහක් පැවිදි වෙති.

ථූපාරාම ධාතු නිධානය අසිරිමත් ය. දකුණු අකු ධාතූන් වහන්සේ අහසට පැන නැගී ගිනි දිය විහිදුවමින් යමක මහා ප්‍රාතිහාර්යය දැක්වූ සේක. මේ අසිරිමත් පෙළහරින් ප්‍රීතියට පත් දෙවනපෑතිස් රජුගේ බාල සොහොයුරෙකු වන මන්තාභය රාජපුත්‍රයා ඇතුලු පුරුෂයින් දහසක් ද තවත් ලක්වැසි කුලපුත්‍රයන් විසිදහසක් ද යන තිස්දහසක් සිංහලයෝ උතුම් බුදු සසුනෙහි පැවිදි බව ලබාගත්හ.

## මිහිඳු මහරහතන් වහන්සේ නාගදීපය ගැන පවසන සේක.

මිහිඳු මහරහතන් වහන්සේගේ මෙහෙයවීමෙන් සිරිලක්බිමට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාව වැඩමවන සේක. ඒ ජය ශ්‍රී මහා බෝධි ශාඛාව මුලින්ම වැඩමවන්නේ මෙකල යාපනයෙහි දඹකොළ පටුනට ය. ප්‍රාතිහාර්යය සහිතව බෝධීන් වහන්සේගේ වැඩමවීම දකින්නට දෙවනපෑතිස් රජු ද මිහිඳු මහරහතන් වහන්සේ අසළ සිටියේය. එදින මිහිඳු මහරහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය ගැනත් නාගදීපය ගැනත් සියලු විස්තර පවසා සිටි සේක. නාගදීපය වන්දනා කිරීම පිණිස සිංහලයන්ව පළමුවෙන් ම යොමුකරන ලද්දේ මිහිඳු මහරහතන් වහන්සේ විසිනි. අප එය අමතක නොකළ යුතුය.

## සිරිමහ බෝ අසිරිය දැක සිංහලයෝ රහත් ඵලය ලබති.

අනේක ප්‍රාතිහාර්යයන්ගෙන් යුක්තව දෙව් මිනිසුන්ගෙන් පුද ලබමින් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සිරිලක්දිවට වැඩි සේක. මහමෙව්නා උයනෙහි පිහිටි රජමිදුලෙහි ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටන කල්හි දස දහසක් සිංහලයෝ මහ බෝධිය දෙස බලමින් බුද්ධානුස්සතිය වැඩූහ. බුද්ධානුස්සතිය පාදක කොට සමථ විදසුන් වඩා අර්හත් ඵලයට පත්ව බුදු සසුනේ පැවිදි බව ලබාගත්හ.

## බෝධීන් වහන්සේගෙන් අංකුරයෝ පැන නගිති.

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා පහක් තිබුණේය. එයින් නැගෙනහිර ශාඛාවෙන් ඉදී මෝරාගිය බෝ ඇටයක් එයින් ගිලිහෙද්දී මිහිඳු මහරහතන් වහන්සේ එය ගෞරවයෙන් පිළිගෙන රජතුමා ලවා රන් කටාරමෙහි රෝපණය කරවන ලදී. එසැණින් ඒ බෝ ඇටයෙන් අට අංකුරයක් පැන නැංගේය. සිව් රියන් උස බෝධීන් වහන්සේලා හටගත් සේක. ඒ බෝධීන් වහන්සේලා අටනම හඳුන්වන්නේ අෂ්ටඵල බෝධීන් වහන්සේලා කියා ය.

ලක්දිව අට තැනක ඒ බෝධීන් වහන්සේලා රෝපණය කරවීමට උපදෙස් දුන් සේක් මිහිඳු මහරහතන් වහන්සේ ය. ප්‍රධාන බෝධීන් වහන්සේගේ ඉතිරි ශාඛා සතරෙන් ද එක් ශාඛාවකින් එක් ඵලය බැගින් බෝ ඇට සතරක් ලැබුණේය. ඒ එක් එක් ඇටයෙන් බෝධීන්

වහන්සේලා අටනම බැගින් ලැබුණාහ. එහි බෝධීන් වහන්සේලා තිස් දෙනමකි. උන්වහන්සේලා හඳුන්වන්නේ දෙතිස්ඵල බෝධීන් වහන්සේලා නමිනි.

## ලක්දිව භික්ෂුණී සංඝයා ද බිහිවෙයි.

බෝධීන් වහන්සේ වැඩමවීමේදී සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ද මෙහෙණ සංඝයා සමග වැඩියහ. ඒ මෙහෙණින් වහන්සේලා මුල්ව අනුලා දේවිය ප්‍රධාන පන්සියයක් සිංහල උපාසිකාවෝ ගෞතම බුදු සසුනෙහි භික්ෂුණී සංඝයා වෙතින් පැවිද්ද ලබාගත්හ.

## අරිට්ඨ රාජපුත්‍රයා පැවිදි වෙයි.

එමෙන්ම අරිට්ඨ රාජපුත්‍රයා ද පන්සියයක් සිංහලයින් සමග මිහිඳු මහරහතන් වහන්සේ වෙතින් පැවිදිව උතුම් අර්හත්වයට පත් වෙති. දැන් බුදුරජාණන් වහන්සේගේ භික්ෂු - භික්ෂුණී - උපාසක - උපාසිකා යන සිව්වණක් පිරිසෙන් සමලංකෘතව, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ආසිරි ලබමින්, ථූපාරාම සෑරජුගෙන් ආසිරි ලබමින්, ලක්දිව පුරා බෝසිසිල හමමින් ගෞතම බුදු සසුන බබළයි.

## ලක්දිව යොදුනෙන් යොදුන ධාතු ස්ථූප ඉදිවෙයි.

දෙවනපෑතිස් රජු ලක්දිව පුරා ස්ථූප ඉදිකරන්නට කැමති වෙයි. ධර්මාශෝක රජුගෙන් ලද සර්වඥ ධාතූන් වහන්සේලා මිහිඳු මහරහතන් වහන්සේගේ අවසරය පරිදි ලක්දිව පුරා ධාතු චෛත්‍ය ඉදිකොට තැන්පත් කරන ලද්දාහ.

අප භාග්‍යවතුන් වහන්සේ දන් වැළඳූ සර්වඥ බුද්ධ පාත්‍රය රාජමාලිගයේ ම පූජ්‍ය වස්තුවක් විය. මිහිඳු මහරහතන් වහන්සේ වෙතින් පැවිදි බව ලැබූ ක්ෂත්‍රීය වංශික අරිට්ඨ රාජපුත්‍රයා ප්‍රධාන කුමාරවරුන් පැවිදිව වාසය කළ තැන ඉසුරුමුනිය නමින් ප්‍රසිද්ධ විය. වෙළඳ කුලයෙන් පැවිදි වූ පන්සියයක් දෙනා වහන්සේ වාසය කළ විහාරය වෙස්සගිරිය නමින් ප්‍රසිද්ධ විය.

## ගෞතම බුදු සසුන සිරිලක බබළයි.

මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කළ මිස්සක පව්ව මිහිඳු තලාව හෙවත් මිහින්තලේ නමින් ප්‍රසිද්ධ විය. ඒ සෑගිරියෙහි උන්වහන්සේ වැඩසිටි තැන මිහිඳු ගුහාව නම් වේ.

මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට මුල් වසරෙහි මහමෙව්නා උයනෙහි කරවන ලද්දේ මහා විහාරය යි. දෙවනුව කරවන ලද්දේ මිහින්තලේ සෑගිරිය යි. තුන්වෙනුව කරවන ලද්දේ ථූපාරාමය යි.

සතරවෙනුව කරවන ලද්දේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටුවාලීම යි. පස්වෙනුව කරවන ලද්දේ රුවන්වැලි මහාසෑයේ විස්තර සඳහන් කොට ගල්ටැඹ පිහිටුවීම යි. එමෙන්ම අප භාග්‍යවතුන් වහන්සේගේ ග්‍රීවා ධාතුන් වහන්සේගේ පිහිටුවීම ද සිදු විය. සයවැනිව කරවන ලද්දේ ඉසුරුමුනි විහාරය යි. සත්වැනිව කරවන ලද්දේ තිසාවැව යි. අටවැනිව කරවන ලද්දේ පඨමක චේතිය යි. නවවැනිව කරවන ලද්දේ වෙස්සගිරි විහාරය යි.

මිහිඳු මහරහතන් වහන්සේ සඟ පිරිස බිහිකොට පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ බුද්ධ ශාසනය

මනාකොට බැබළවූ සේක. ත්‍රිපිටක ධර්මය කටපාඩම් කරවූ සේක. එහි අරුත් හෙළබසින් පවසා අටුවා කළ සේක. භාණක පරම්පරා බිහිකළ සේක. අපගේ මිහිඳු මහරහතන් වහන්සේගේ දූරදර්ශී බව ද අසිරිමත් ය. අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රධාන ලක්දිව පහළ වූ භික්ෂූන් වහන්සේලා ලවා ථූපාරාම සෑ මළුවේ විනය සංගායනාවක් කරවූ සේක. අහෝ...! මොනතරම් අසිරිමත් ද...!

මිහිඳු මහරහතන් වහන්සේ මග පෙන්වීම හේතුවෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිව්වණක් ශ්‍රාවක පිරිසට ධර්මයේ හැසිරෙන්නට නිසි පතිරූපදේසවාසයක් මෙසිරිලක බිහිවිය. ධර්මාශෝක නිරිඳුන් විසින් එවන ලද ශිල්පීන්ගේ උපකාරයෙන් නව විහාර කර්මාන්ත ද සිදුවිය.

දෙවනපෑතිස් රජුගේ රාජ්‍ය කාලය සතළිස් වසරකි. මිහිඳු මහරහතන් වහන්සේ ජීවමානව වැඩසිටියදී ම රජුගේ අභාවය සිදුවිය. ගෞතම බුදු සසුන සිරිලක්වාසීන්ට දායාද කිරීම පිණිස දෙවනපෑතිස් රජු විසින් දක්වන ලද අනුග්‍රහය වචනයෙන් වර්ණනා කොට අවසන් නොකළ හැකි තරම් අසිරිමත් ය.

රජුගෙන් පසු රජකම උදෙසා රාජපුත්‍රයෙකු නොසිටි හෙයින් සිය මලණුවන් වන උත්තිය රාජපුත්‍රයා රජබවට පැමිණියේය.

## සිරිලක එළිය කළ හිරු මඬල බැස යයි.

එකල්හී උත්තිය රජු රාජාභිෂේකය ලැබ අටවෙනි වසර ය. අපගේ මිහිඳු මහරහතන් වහන්සේට වයස අසූවකි. උපසම්පදාවෙන් සැටවසක් ගත කළ සේක.

එකල්හී මිහිඳු මහරහතන් වහන්සේ මිහින්තලේ සෑගිරි විහාරයේ වැඩහුන් සේක. සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය බව පසක් කරමින් පහන් සිලක් නිවී යන ලෙසින් අපගේ පරම කළ්‍යාණමිත්‍ර වූ සිංහලයාගේ මහා ආධ්‍යාත්ම ගුරුවරයාණන් වහන්සේ වූ මිහිඳු මහරහතන් වහන්සේ පිරිනිවී ගිය සේක.

ඒ වප් මාසයේ පුර පක්ෂයේ අටවක දවසයි. එනිසා වප් මාසයේ පුර අටවක දවස එකල සිංහලයෝ හැඳින්වූවාහු 'ශ්‍රී මිහිඳු පුර අටවක' නමිනි.

## මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහයට පූජා පවත්වති.

මිහිඳු මහරහතන් වහන්සේගේ පිරිනිවන් පෑම ඇසූ උත්තිය රජු සෝකහුලින් පහර කන ලද්දේය. මිහින්තලේ සෑගිරියට ගොස් මහරහතන් වහන්සේගේ නිසල ශ්‍රී දේහයට වන්දනා කොට උන්වහන්සේගේ ගුණ ගායනා කරමින් හඬා වැලපුනේය.

රන් දෙණක සුවඳ තෙල් පුරවා මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහය එහි තැන්පත් කරන ලද්දේය. ඒ දෙණ හොඳින් වසා රන් කුළුගෙයක් මත තබවා සාදුනාද පවත්වමින් අනුරාධපුරයට වඩමවාගෙන එන ලද්දේය.

අනුරාධපුර නගරය අලංකාරයෙන් සරසන ලද්දේය. තොරණ් බන්දවන ලද්දේය. ධජ පතාක ඔසොවන ලද්දේය. මල් මාලාවන්ගෙන් සරසන ලද්දේය. පුන්කළස් තබ්බවන ලද්දේය.

අනුබුදු මාහිමියන් වහන්සේගේ ශ්‍රී දේහය බැහැදකින්නට පංච මහා ගංගාවන් ගලන සෙයින් ලක්දිවින් ජන ගංගාව ගලා ආවේය. ජනයාගේ නෙතින් ගැලූ කඳුළින් අනුරාධපුර නගරය තෙමී ගියේය.

මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහය පඤ්චම්බ මාලකයෙහි කූටාගාරයක තැන්පත් කරවා සත් දිනක් පූජෝපහාර පවත්වන ලද්දේය.

## මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කරති.

අනුරාධපුරයෙන් නැගෙනහිර දිසාවෙහි බද්ධමාලක නම් තැන සඳුන් දරින් චිතකයක් කරවන ලද්දේය. මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහය රැගෙන ථූපාරාම සෑය ද පැදකුණු කරමින් එතැනට වැඩමවාගෙන ඇවිත් ඒ සිත්කලු චිතකයෙහි කූටාගාරය තැන්පත් කරවූයේය.

සිංහල රහතන් වහන්සේලා ද සිංහල රහත් භික්ෂුණීන් වහන්සේලා ද ධර්ම සංවේගය සිහි කරමින් අනිත්‍ය ප්‍රතිසංයුත්ත වූ සම්බුද්ධ දේශනාවන් සජ්ඣායනා කළ සේක.

මගඵල නොලත් භික්ෂූන් වහන්සේලා ද භික්ෂුණීන් වහන්සේලා ද හඬා වැලපෙමින් මිහිඳු මහරහතන් වහන්සේගේ ගුණ කියන්ට පටන් ගත්හ. මගඵලලාභී උපාසක උපාසිකාවෝ ධර්ම සංවේගයෙන් බලා සිටියහ. අවශේෂ උපාසක උපාසිකාවෝ චණ්ඩ මාරුතයෙන් ඇදහැලෙන වෘක්ෂයන් පරිද්දෙන් සෝකහුලින් පහර කන ලදුව හඬා වැලපෙමින් ඇදවැටුණාහ.

අහසින් මල් වරුසා ඇදහැලුණේය. ලක්වැසි දෙවියන්ගේ සෝකී රාවය සියල්ලන්ට ම අසන්ට ලැබුණේය. මිහිඳු මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහයට ගිනි දල්වන ලදුව අනිත්‍ය ධර්මය පසක් කරමින් ගිනි ඇවිල ගියේය.

මිහිඳු මහරහතන් වහන්සේගේ ධාතූන් වහන්සේලා තැන්පත් කොට එතැන චෛත්‍යයක් කරවන ලදී. උන්වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කළ ස්ථානයට ගෞරව කිරීම පිණිස 'ඉසිභූමංගන' යන නම තබන ලදී.

අහෝ...! ඒකාන්තයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු සංස්කාරයෝ හටගෙන නැසීයන ස්වභාවයෙන් යුක්තයහ. මෙබඳු ස්වභාවයෙන් යුක්ත වූ සංස්කාර ධර්මයන්ගේ සංසිඳී යෑම සදහටම සිදුවෙමින් යම් රහතන් වහන්සේ නමක් පිරිනිවන් පානා සේක් ද, ඒ සංසිඳී යෑම සැපයකි.

ඒ අපගේ පරම කළ්‍යාණමිත්‍ර වූ ලංකාදීපප්පසාදක වූ මිහිඳු මහරහතන් වහන්සේට පළමුවත් දෙවනුවත් තෙවනුවත් නමස්කාර කරමි. අපගේ නමස්කාරය වේවා!

**සාදු! සාදු!! සාදු!!!**

# පසුවදන

ලංකාදීපප්පසාදක වූ මිහිඳු මහරහතන් වහන්සේ අපගේ පරම පූජනීය කළ්‍යාණ මිත්‍රයාණෝ ය. අප කෙරෙහි දැක්වූ කරුණාව නිසාවෙන් උන්වහන්සේ අපට ශාස්තෘන් වහන්සේ සමානයහ. සිය නිකෙලෙස් හද මඬල නමැති දියමන්ති මංජුසාවෙහි පරම පිවිතුරු ශ්‍රී සද්ධර්මය නමැති සිංහතෙල රඳවාගෙන ලක්දිවට වැඩම කළ සේක. උන්වහන්සේගේ නිකෙලෙස් හද මඬලින් දරාගෙන වැඩි උතුම් ශ්‍රී සද්ධර්මය තුළින් ලක්වැසි පුණ්‍යවන්තයෝ මහරහතන් වහන්සේලා බවට පත් වූ සේක. දිවි හිමියෙන් තෙරුවන් සරණ ගිය ලක්වැසියන්ගේ ශාසන මාතෘ උන්වහන්සේ ය. විමුක්ති සිත් පෝෂණය කළ පීතෘ උන්වහන්සේ ය.

අපගේ මිහිඳු මහරහතන් වහන්සේ මෙහි වැඩම නොකරන්නට අප තවමත් දීන මිනිසුන් ය. අණක් ගුණක් නොමැති ම්ලේච්ඡ ජාතියක් වන්නට සිටි සිංහලයා, ලොවෙහි උතුම් ම ආර්ය ජාතිය බවට පත් කළෝ උන්වහන්සේ ම ය. දෙවනපෑතිස් මහරජුන්ගේ මුතුන්මිත්තන්ගේ පරපුර වනාහී යකුන් යකිනියන් සමග කෙළිදෙළෙන් ගත කළ පිරිසකි. ඇත්තෙන්ම ලක්දිව යක්ෂද්වීපයක් කළෝ ඔවුහු ය. එනමුදු අප අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ එකී යක් පුරය දම් සුවඳ හමන ධර්මද්වීපයක් කළෝය. ගෞතම බුදුරජුන්ගේ දහම් ගබඩාව කළෝය. ලක්දිව පැවති යක්ෂ විලාපය සාදුනාදයෙන් සෝදාහළ සේක. ගස්, ගල්, පර්වත, යකුන්, යකිනියන්

ඇදහීම නමැති මිථ්‍යාදෘෂ්ටික අන්ධකාරය දුරුකළ රිවි මඬල වනාහී අපගේ මිහිඳු මහරහතන් වහන්සේ ම ය.

මේ ලක්දිව සසුන් කෙත වැපුරූ උන්වහන්සේ ලක් බුදු සසුන එකළු කළ පහන් රැක වූ සේක. හෙළ වැසියන්ගේ සැබෑ ම විමුක්තිදායකයාණෝ උන්වහන්සේ ය. බෝපත් ලෙලදී හමායන සුළං රැළි ලක්වැසියන්ගේ සෝතැවුල් සංසිඳවූහ. අවිද්‍යාවෙන් තෙත්ව දුකින් බර වූ දෙනෙත් මහා ස්ථූප නමැති අඳුනින් සිහිල් කළ සේක. ලක්වැසියන්ගේ දුක් ගිනි නිවූ මිහින්තලාවෙන් ගැලූ සිහිලැල් දහම් නදිය උන්වහන්සේ ම ය. මිහින්තලාවෙන් පැයූ කෙලෙස් විඩා නිවාලන පොසොන් පුන් සඳ උන්වහන්සේ ය. අපගේ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ඉතා අපූර්ව වූ සදහම් නගරයත් සිරිලක් බිමෙහි නිර්මාණය කළ සේක.

**ලංකාපසාදනගුණේන වියාකතෝ සෝ**
**ලංකාහිතාය මුනිනා සයිතේන අන්තේ**
**ලංකාය සත්ථුසදිසෝ හිතහේතු තස්සා**
**ලංකාමරූහි මහිතෝ'භිනිසීදි තත්ථාති.**

ලක්දිව කෙරෙහි හිතානුකම්පී වූ අපගේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ විසින් පිරිනිවන් පානා මොහොතෙහි සල් රැක් සෙවණෙහි සැතපී සිට ලංකාදීපප්පසාදක ගුණයෙන් හෙබි මිහිඳු මහරහතන් වහන්සේ ගැන අනාවැකියක් වදාළ සේක. ලංකාවට ශාස්තෘන් වහන්සේ නමක් බඳු අප මිහිඳු මහරහතන් වහන්සේ ලක්වැසි දෙවියන්ගෙන් පිදුම් ලබමින් ලංකාවෙහි යහපත උදෙසා වැඩම කළ සේක.

# සිරිලක එකළු කළ අසිරිමත් පහන් ටැඹ

## පරම පූජනීය මිහිඳු මහරහතන් වහන්සේ

ලංකාපසාදනගුණේන වියාකතෝ සෝ
ලංකාහිතාය මුනිනා සයිතේන අන්තේ
ලංකාය සත්ථුසදිසෝ හිතහේතු තස්සා
ලංකාමරූහි මහිතෝ'භිනිසීදි තත්ථාති.

ලක්දිව කෙරෙහි හිතානුකම්පී වූ අපගේ ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ විසින් පිරිනිවන් පානා මොහොතෙහි සල් රුක් සෙවණෙහි සැතපී සිට ලංකාදීපප්පසාදක ගුණයෙන් හෙබි මිහිඳු මහරහතන් වහන්සේ ගැන අනාවැකියක් වදාළ සේක. ලංකාවට ශාස්තෘන් වහන්සේ නමක් බඳු අප මිහිඳු මහරහතන් වහන්සේ ලක්වැසි දෙවියන්ගෙන් පිදුම් ලබමින් ලංකාවෙහි යහපත උදෙසා වැඩම කළ සේක.

**මහමෙව්නාව භාවනා අසපුව**
වඩුවාව, යටිගල්ඔළුව, පොල්ගහවෙල.
Tel : (+94) 372244602, (+94) 374942746 | e-mail : info@mahamevnawa.lk
Web : www.mahamevnawa.lk